**පාසල් අධ්‍යාපන ක්‍රමය දැනුමේ කේන්ද්‍රීය පදනම ලෙස පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතිය - 2018**

---

පාසල් අධ්‍යාපන ක්‍රමය දැනුමේ කේන්ද්‍රීය පදනම ලෙස පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතියේ 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ජාත්‍යන්තර සංවර්ධන සංගමය අතර 2012 මැයි 18 දින එළඹි අංක 5037 - එල්කේ දරන මූල්‍ය ගිවිසුමේ උපලේඛන 2 හි II (ආ) (3) වගන්තිය සහ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය සහ ඕස්ට්‍රේලියානු භාර අරමුදල අතර 2013 ජුලි 18 දින එළඹි අංක ටීඑෆ් 013267 දරන ඕස්ට්‍රේලියානු ප්‍රදාන ගිවිසුමේ II (ආ) (3) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත වාර්තා කළ යුතු යැයි මා සලකන මාගේ අදහස් දැක්වීම් සහ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා ව්‍යාපෘති කාලය

ව්‍යාපෘතියේ මූල්‍ය සහ ප්‍රදාන ගිවිසුම් වලට අනුව, අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරවීමේ ආයතනය වන අතර සියළුම පළාත් වල පළාත් අධ්‍යාපන අමාත්‍යාංශ ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ නියෝජිතායතනය වේ. ව්‍යාපෘතියේ අරමුණු වනුයේ, ශ්‍රී ලංකාවේ දැනුම පදනම් වූ ආර්ථිකය සහ සමාජ සංවර්ධනය සඳහා අත්තිවාරමක් සැපයීම සඳහා ප්‍රාථමික හා ද්විතියික අධ්‍යාපන ප්‍රවේශය හා ගුණාත්මක බව වැඩි කිරීමයි. මූල්‍ය හා ප්‍රදාන ගිවිසුම්වලට අනුව, රු.මිලියන 18,845 කට සමාන එජඩො මිලියන 139.11 ක් වන අතර ඉන් රු.මිලියන 13,000 කට සමාන එජඩො මිලියන 100 ක් මූල්‍යනය කිරීමට ජාත්‍යන්තර සංවර්ධන සංගමය එකඟ වී තිබුණි. ඉතිරි මුදල වන රු.මිලියන 5,845 කට සමාන එජඩො මිලියන 39.11 ක් මූල්‍යයනය කිරීමට ඕස්ට්‍රේලියානු භාර අරමුදල එකඟ වී තිබුණි. ව්‍යාපෘතියේ කාර්යයන් 2012 ඔක්තෝබර් 01 දින ආරම්භ කරන ලද අතර 2017 ජුනි 30 වන විට නිම කිරීමට සැලසුම් කර තිබුණි. කෙසේවෙතත් ව්‍යාපෘතියේ කටයුතු නිම කිරීමේ දිනය 2018 ජුනි 30 දක්වා දීර්ඝ කර තිබුණි.

## 1.3 මතය

2018 දෙසැම්බර් 31 දිනට පාසල් අධ්‍යාපන ක්‍රමය දැනුමේ කේන්ද්‍රීය පදනම ලෙස පරිවර්තනය කිරීමේ ව්‍යාපෘතියේ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පළාත් 09 හි පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ සහ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන මගින් සපයන තොරතුරු සමග එකගවන අතර පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.4 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.5 ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පොදුවේ පිළිගත් ගිණුම් මූලධර්මවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල

කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.
ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

## 1.6 ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාවේ ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී

## 2. මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 නීති, රීති සහ රෙගුලාසිවලට අනුකූල නොවීම

| නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාර | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| මුදල් හා ක්‍රම සම්පාදන අමාත්‍යාංශයේ 2007 අගෝස්තු 07 දිනැති අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/02 දරන චක්‍රලේඛය | සමාලෝචිත වර්ෂය සඳහා ඒකාබද්ධ කළමනාකරණ වාර්තාව 2019 මාර්තු 31 දිනට ඉදිරිපත් කළ යුතු වුවත් 2019 ජුනි 13 දින ඉදිරිපත් කර තිබුණි. | ප්‍රධාන අවශ්‍යතාවයකට යොමුවී නොමැත. | පළාත් විසර්ජන ගිණුම් අවසන් කිරීමෙන් පසු ඒකාබද්ධ මූල්‍ය කළමනාකරණ වාර්තාව පිළියෙල කරනු ලැබේ. | චක්‍රලේඛයේ දක්වා ඇති අවශ්‍යතාවයන්ට අනුගතවීම අවශ්‍ය වේ. |

## 3. භෞතික කාර්යසාධනය

### 3.1 ව්‍යාපෘතියේ කටයුතු පිළිබඳ භෞතික ප්‍රගතිය

ව්‍යාපෘතියේ මූල්‍ය ගිවිසුමේ උපලේඛන 01 ට අනුව ප්‍රාථමික හා ද්විතික අධ්‍යාපනයට ප්‍රවේශවීම් ප්‍රවර්ධනය කිරීම, අධ්‍යාපනයේ ගුණාත්මකභාවය වර්ධනය කිරීම සහ අධ්‍යාපන සේවයේ පාලනය හා බෙදාහැරීම සවිබල ගැන්වීම යනාදි ප්‍රධාන අරමුණු 3 ක් යටතේ වියපැහැදම් සම්බන්ධ දර්ශක ළඟාකර ගැනීමට අපේක්ෂා කෙරේ. පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රසිද්ධ කරන ලද ශ්‍රී ලංකාවේ ආර්ථික සහ සමාජ සංඛ්‍යාලේඛන-2019 වාර්තාවට අනුව රටේ පාසල් 3,046 ක ශිෂ්‍ය ගණනය ශිෂයන් 100 කට වඩා අඩු පවතින අතර එවැනි පාසල් 503 ක් මධ්‍යම පළාතට ඇතුළත් වේ. තවද, පාසල් 79 ක ශිෂ්‍යයන් 3,500 කට වඩා වැඩියෙන් පවත්න අතර එවැනි පාසල් 34 ක් බස්නාහිර පළාතට ඇතුළත් වේ. තවද අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලබාගත හැකි වූ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂය තුළදී දිස්ත්‍රික්ක 21 ක පාසල් 101 වසා දමා තිබුණි. | ව්‍යාපෘතියේ අරමුණු අත්කර ගත නොහැකි වේ. | පාලනය කර ගත නොහැකි හේතුවෙන් මධ්‍යම පළාතේ පාසල් අතර ශිෂ්‍යයින් 100 කට වඩා අඩු පාසල් 501 පවතින බව සත්‍යක් වේ. | ප්‍රතිපත්ති තීරණ ගැනීම සඳහා සංඛ්‍යා වලින් දැක්වෙන කරුණු අවබෝධ කර ගැනීමට අවධානය යොමු කිරීම අවශ්‍ය වේ. |
| (ආ) | අධ්‍යාපන අමාත්‍යාංශයෙන් ලැබුණු තොරතුරු අනුව පාසල් විදුහල්පති තනතුරු 16,512 කින් අනුමත කාර්ය මණ්ඩලය සමන්විත වන අතර ඉන් | පාසල් පරිපාලන යාන්ත්‍රණය අඩපණ විය | අදහස් දක්වා නොමැත. | පාසල් පරිපාලන පද්ධතිය ශක්තිමත් කිරීම අවශ්‍ය වේ. |

| | |
|---|---|
| 2018 දෙසැම්බර් 31 දින වන විට පාසල් විදුහල්පතිවරුන් 10,776 ක් පමණක් සේවයේ යෙදී තිබුණි. | හැක. |

**3.2 ඌන උපයෝජිත සම්පත්**

| | විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ලැබී තිබුණු තොතුරු අනුව ව්‍යාපෘතියේ කාලපරිච්ඡේදය තුළ ව්‍යාපෘතියේ කටයුතු ක්‍රියාත්මක කිරීමට එකතුව රු.මිලියන 18,845 ක ප්‍රතිපාදනයක් සිදුකර තිබුණු අතර ඉන් 2018 දෙසැම්බර් 31 දිනට රු.මිලියන 13,812 ක් පමණක් උපයෝජනය කර තිබුණි. පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.<br><br>(i) සමාලෝචිත වර්ෂය තුළදී මධ්‍යම පළාතේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශය සඳහා මහා භාණ්ඩාගාරය මඟින් නිදහස් කරන ලද එකතුව රු.මිලියන 1,557.73 ක ප්‍රතිපාදනයෙන් 2018 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 1,317.67 ක් පමණක් උපයෝජනය කර තිබුණි. එකතුව රු.මිලියන 240.06 ක වියදම් නොකළ ණය මුදල පළාතේ ප්‍රදේශිය අධ්‍යාපන කාර්යාල වලට බෙදාහැර තිබුණි.<br><br>(ii) සමාලෝචිත වර්ෂය තුළදී ඌව පළාතේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට කරන ලද රු.මිලියන 180.42 ක අග්‍රිම මුදලින් 2018 දෙසැම්බර් 31 දිනට එකතුව රු.මිලියන 178.99 ක් පමණක් වියදම් කර තිබුණි. | අපේක්ෂිත අරමුණු ලඟා නොවනු ඇත. | ව්‍යාපෘතියේ අනුමැතිය යටතේ පාසල් සංවර්ධනය සමිතිවලට පළාත් පාසල් පාදක ඉගෙනුම් ප්‍රවර්ධන ප්‍රදාන වැඩ සටහන යටතේ එකතුව රු.මිලියන 242.68 ක් වෙන්කර තිබුණි. | ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු සඳහා අරමුදල් භාවිතා කළ යුතුය. |
| (ආ) | පළාත් අධ්‍යාපන අධිකාරීන් විසින් ණය මුදලින් මිලදී ගන්නා ලද වත්කම් අපේක්ෂිත අරමුණු සඳහා භාවිතා නොකරන බව පළාත් | අපේක්ෂිත පාර්ශවයන් වෙත අපේක්ෂිත | සබරගමුව පළාත් සභාව විසින් මිලදී ගන්නා ලද උපකරණ පිළිබඳව පරීක්ෂා කර | අපේක්ෂිත අරමුණු සඳහා වත්කම් සහ අනෙකුත් උපකරණ |

| | | | |
|---|---|---|---|
| මට්ටමින් සිදුකරන ලද විස්තරාත්මක විගණන පරීක්ෂාවේදී අනාවරණය වී තිබුණි.<br><br>(i) උපකරණවල අඩු ගුණාත්මක බව හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී පළාත් පාසල් 45 ක භාවිතය සඳහා පිරිවැය රු.මිලියන 13.07 කට මිලදී ගන්නා ලද විද්‍යා උපකරණ අදාල පාසල් විසින් භාවිතා නොකර පැවතුණි.<br>(ii) ව්‍යාපෘති කාල පරිච්ඡේදය තුළදී ව්‍යාපෘතිය විසින් මිලදී ගන්නා ලද හා බෙදාහරින ලද උපකරණ භාවිතය පිළිබඳ අධීක්ෂණය කිරීමේ ක්‍රමවේදයක් නොතිබුණි. | ප්‍රතිලාභ නොලැබේ. | වාර්තා කරන ලෙස සබරගමු පළාත් සභාවේ ප්‍රධාන ලේකම් දන්වා තිබුණි. | උපයෝජනය කළ යුතුය. |